සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

12515

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2015
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I - II | කාලය / காலம் / Time: පැය 02 |

## I පත්‍රය

- සැලකිය යුතුයි. : I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. විවිධ පරිසරවල පවත්නා අජෛව සාධක එම පරිසර වාසස්ථාන කොට ගත් ජීවීන් සතු ලක්ෂණ සමග සම්බන්ධතාවයක් ඇත. දැඩි හිරු රශ්මිය, ඉහළ උෂ්ණත්වය සහ පසෙහි ජලය හිඟ බව යන ලක්ෂණ දැකිය හැක්කේ,
    (1) වෙරළබඩ පරිසරවල ය. (2) ශුෂ්ක පරිසරවල ය.
    (3) කඩොලාන පරිසරවල ය. (4) තෘණ භූමිවල ය.

02. පාංශු ඛාදනය නිසා පස නිසරුවීම හේතුවෙන් බෝගවල අස්වැන්න අඩු වේ. පාංශු ඛාදනයට වැඩි වශයෙන්ම භාජනය වන පරිසර වන්නේ,
    (1) ආවරණ වගා සහිත බෑවුම් ප්‍රදේශ ය. (2) ආවරණ වගා සහිත තැනිතලා ප්‍රදේශ ය.
    (3) ආවරණ වගා රහිත බෑවුම් ප්‍රදේශ ය. (4) ආවරණ වගා රහිත තැනිතලා ප්‍රදේශ ය.

03. පරිසර සන්තතිය නැමැති ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය ස්ථාවර උත්කර්ෂ ජෛව ප්‍රජාවක් ස්ථාපනය වීමයි. පරිසර සන්තතිය පිළිබඳ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
    (1) පරිසර සන්තතිය නිසා විනාශ වූ පරිසර පුනරුත්ථාපනය වේ.
    (2) මෙය සෑම විටම අපට වාසිදායකය.
    (3) ජලාශයක් ගොඩවීම මේ නිසා සිදු වේ.
    (4) දෘඪ කළුගල් පර්වතයකින් මෙය ආරම්භ විය හැකිය.

04. සමාකාර ඝන වස්තුවල පරිමාව සෙවීම සඳහා ගණිත ක්‍රම භාවිත කළ හැකිය. ඝනකයක එක් දාරයක දිග 5 cm වේ. එහි පරිමාව වනුයේ,
    (1) $25\ cm^3$ (2) $50\ cm^3$ (3) $125\ cm^3$ (4) $250\ cm^3$

05. දුර කාලය, ස්කන්ධය යන රාශි මැනීමට යොදාගන්නා අන්තර් ජාතික සම්මත ඒකක පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
    (1) m, kg, s (2) kg, s, m (3) s, m, kg (4) m, s, kg

06. යම් ද්‍රව්‍යයක $4\ m^3$ ක ස්කන්ධය 3200 kg නම්, එම ද්‍රව්‍යයේ ඝනත්වය කොපමණ වේද?
    (1) $80\ k\,gm^{-3}$ (2) $800\ k\,gm^{-3}$ (3) $8000\ k\,gm^{-3}$ (4) $8\ k\,gm^{-3}$

07. මිනිස් සිරුර තුළ ද්‍රව්‍ය පරිවහනය සහ රෝගවලින් ආරක්ෂා කිරීම සිදු කෙරෙනුයේ කිනම් පද්ධතිය මගින්ද?
    (1) ස්නායු පද්ධතිය (2) බහිස්‍රාවීය පද්ධතිය
    (3) ආහාර ජීර්ණ පද්ධතිය (4) රුධිර සංසරණ පද්ධතිය

08. පසෙහි ඇති විවිධ සංඝටකවල බහුලතාව අනුව පස් වර්ග කිපයක් හඳුනාගත හැකිය. ලෝම් පසෙහි ලක්ෂණයක් නොවන්නේ,
    (1) හොඳින් වාතනය වී පැවතීමය. (2) ජලවහනය මනාව සිදුනොවීමය.
    (3) ජලය හා ඛනිජ පැවතීමය. (4) ජෛන්ද්‍රිය ද්‍රව්‍ය හොඳින් දිරාපත්වීමය.

09. හේලිගේ ධූම කේතුව වසර 76 කට වරක් පෘථිවියට දිස් වේ. මෙසේ ඇතැම් ධූම කේතු නිශ්චිත කාලයට වරක් නැවත දිස්වීමට හේතුව ඒවා,
(1) සරල රේඛීයව ගමන් කිරීම ය. (2) ඉලිප්සාකාර පථවල ගමන් කිරීම ය.
(3) බහුවලයික පථවල ගමන් කිරීම ය. (4) ඉහත කිසිවක් නොවේ.

10. සංශුද්ධ ද්‍රව්‍ය, සංයෝග සහ මූලද්‍රව්‍ය ලෙස වර්ග කළ හැකිය. පහත දී ඇති ද්‍රව්‍ය අතරින් සංයෝගයක් නොවන ද්‍රව්‍යය තෝරන්න.
(1) කාබන්ඩයොක්සයිඩ් (2) ජලය
(3) හුණුගල් (4) ගෙන්දගම්

11. තනුක හයිඩ්‍රොක්ලෝරික් අම්ල ස්වල්පයක් පරීක්ෂා නළයකට ගෙන, එයට මැග්නීසියම් පටි කැබැල්ලක් දැමූ විට වේගයෙන් වායු බුබුළු පිටවනු දැකිය හැකිය. මෙහිදී පිටවන වායුව කුමක්ද?
(1) හීලියම් (2) හයිඩ්‍රජන් (3) ඔක්සිජන් (4) නයිට්‍රජන්

12. රසදියවල ඝනත්වය 13600 $kgm^{-3}$ එහි සාපේක්ෂ ඝනත්වය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) 136 (2) 13.6 $kgm^{-3}$ (3) 13.6 (4) 136 $kgm^{-3}$

13. සූර්යාලෝකයට නිරාවරණය කර තැබූ පත්තර කඩදාසියක් කහ පැහැයට හැරී තිබෙනු දක්නට ලැබිණි. මෙයට හේතුව විය හැක්කේ,
(1) තාප හායනයයි. (2) තාප වියෝජනයයි.
(3) තාප ප්‍රසාරණයයි. (4) තාප සංක්‍රමණයයි.

14. දෙවන වර්ගයේ ලීවර පමණක් දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) ගිරය, වීල්බැරෝව, කතුර (2) සීසෝව, ගිරය, කතුර
(3) ගිරය, වීල්බැරෝව, බෝතල් මූඩි අරිනය (4) සීසෝව, බෝතල් මූඩි අරිනය, අඬුව

15. තේවල අඩංගු අම්ලය කුමක්ද?
(1) ටාටරික් අම්ලය (2) සිට්‍රික් අම්ලය
(3) ඇසිටික් අම්ලය (4) ටැනික් අම්ලය

16. අම්ල භෂ්ම සහ උදාසීන ද්‍රව්‍ය හඳුනාගැනීමට විවිධ දර්ශක භාවිත වේ. ෆිනොප්තැලීන් දර්ශකය භෂ්මයකදී දක්වන වර්ණය කුමක්ද?
(1) රෝස (2) නිල් (3) කොළ (4) කහ

17. ස්පර්ශ විමකින් තොරව වස්තු මත ක්‍රියාත්මක වන බල දුරස්ථ බල වේ. ඒ සඳහා උදාහරණයක් වන්නේ,
(1) ආවේගශීලී බල ය. (2) චුම්භක බල ය.
(3) ඝර්ෂණ බල ය. (4) ආතති බල ය.

18. පාපැදියක පැඩලය මත යොදන බලය, පිටුපස රෝදයට සම්බන්ධ දැති රෝදය කරා සම්ප්‍රේෂණයට යොදා ඇති උපක්‍රමය කුමක්ද?
(1) දැති රෝද යෙදීම (2) නොහිම් පටි යෙදීම.
(3) නොහිම් දම්වැල් යෙදීම (4) දඬු යෙදීම.

19. පහත දක්වෙන ශක්ති ප්‍රභව අතරින් පරිසර දූෂණයකින් තොරව භාවිතයට ගත හැකි ශක්ති ප්‍රභවය කුමක්ද?
(1) L. P. ගෑස් (2) ගල්අඟුරු (3) සුළඟ (4) ඩීසල්

20. නායයෑම් ඇතිවීමට අඩුවෙන්ම බලපෑ හැකි සාධකය සොයන්න.
(1) වන වැස්ම ඉවත් කිරීම (2) කෙටි කාලයකදී ඇද හැලෙන තද වැසි
(3) අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති (4) කෙටිකාලීන නියඟ

## II පත්‍රය

- **පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. (A) සූර්යයා පෘථිවියට ශක්තිය සපයන මූලික ප්‍රභවයයි. සූර්ය ශක්තිය ගබඩා වී ඇති විවිධ ආකාර පිළිබඳව සිසු කණ්ඩායමක් විසින් බිත්ති පුවත්පතකට සකස් කළ ලිපියක පහත සටහන දක්නට ලැබිණි.




**සූර්ය ශක්තිය ගබඩා වන ආකාර**

(i) ඉහත සිසුන් තම ලිපිය සකස් කිරීමේදී තොරතුරු ලබාගන්නට ඇතැයි සිතිය හැකි මූලාශ්‍ර 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) සූර්යයාගෙන් පෘථිවියට ශක්තිය ලැබෙන්නේ කිනම් ශක්ති ප්‍රභේද ලෙසද? (ලකුණු 01)

(iii) ගලාගෙන යන ජලයට සූර්යයාගෙන් ශක්තිය ලැබුණේ කෙසේදැයි ඉහත ලිපිය සකස් කළ සිසුන්ගෙන් විමසුවේ නම් ඔවුන් ලබා දෙන්නට ඇතැයි සිතිය හැකි නිවැරදි පිළිතුර ලියන්න. (ලකුණු 01)

(iv) සූර්ය ශක්තිය කෘත්‍රිම ලෙස ගබඩා වන ක්‍රම දෙකක් දක්වන්න. (ලකුණු 01)

(v) ශාක හා සත්ත්ව දේහ තුළ සූර්ය ශක්තිය ගබඩා කෙරෙන්නේ කිනම් ශක්ති ආකාරය ලෙසද? (ලකුණු 01)

(B) අවුරුදු මිලියන ගණනකට පෙර පොළව යට වැළලී ගිය ශාක හා සත්ත්ව දේහවලින් ෆොසිල ඉන්ධන නිර්මාණය වන්නට ඇතැයි සැලකේ.

(i) ෆොසිල ඉන්ධන සඳහා නිදසුන් 2 ක් දක්වන්න. (ලකුණු 01)

(ii) වර්තමානයේ ෆොසිල ඉන්ධන වෙනුවට වෙනත් විකල්ප ශක්ති භාවිතය සඳහා නැඹුරුවක් ඇත. එයට හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) බල ශක්ති අවශ්‍යතා සඳහා සූර්ය ශක්තිය යොදා ගැනීම පරිසර හිතකාමී මෙන්ම වාසිදායක වුවද එය ජනප්‍රිය නොවීම කෙරෙහි බලපෑ හැකි හේතු 2 ක් දක්වන්න. (ලකුණු 02)

(C) අපගේ දෛනික ක්‍රියාකාරකම්වලදී ශක්ති සම්ප්‍රේෂණ උපක්‍රම භාවිත කිරීමට සිදු වේ.

(i) ශක්ති සම්ප්‍රේෂණය යන්න හඳුන්වන්න. (ලකුණු 01)

(ii) ශක්ති සම්ප්‍රේෂණ උපක්‍රම 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) මහන මැෂිමක දැකිය හැකි ශක්ති සම්ප්‍රේෂණ උපක්‍රමයක් දක්වන්න. (ලකුණු 01)

(iv) ද්‍රව තුළින් ශක්ති සම්ප්‍රේෂණ සිදු කරන අවස්ථාවකට උදාහරණයක් ලියන්න. (ලකුණු 01)

02. (A) පහත දැක්වෙන වගන්ති නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (×) ලකුණද වරහන් තුළ දක්වන්න.

(i) ආහාර දාමයක පළමු පුරුක සැම විටම හරිත ශාකයකි. ( )

(ii) ද්‍රව්‍ය පිරිමැදීමේදී ස්ථිති විද්‍යුත් ආකර්ෂණ බල ඇති වේ. ( )

(iii) විභව අන්තරය මැනීමට ඇමීටරය යොදාගත හැකිය. ( )

(iv) ශාකවලට සංචරණය කිරීමේ හැකියාවක් නැත. ( )

(v) අපට ස්වභාවික ආපදා බලපාන්නේ නැත. ( )

(vi) ජලයෙන් විදුලිය නිපදවීමේදී යාන්ත්‍රික ශක්තිය විද්‍යුත් ශක්තිය බවට පත් වේ. ( )

(vii) ඉස්කුරුප්පුව ආනත තලයකි. ( )

(viii) පෘථිවිය තම අක්ෂය වටා භ්‍රමණය වීම වෘත්ත චලිතයකි. ( )

(ix) චුම්භකවල ඕනෑම ධ්‍රැව 2 ක් එකිනෙක ආකර්ෂණය වේ. ( )

(x) ඝර්ෂණ බල කෙරෙහි ස්පර්ශ පෘෂ්ඨවල ස්වභාවය බලපායි. ( )

(xi) ආතති බල දුරස්ථ බල වේ. ( )

(xii) සම්පීඩිත වාතය මගින් ශක්තිය සම්ප්‍රේෂණය කළ හැකිය. ( )

(ලකුණු 06)

(B) ගැළපෙන පද යා කරන්න.

| | |
|---|---|
| (i) ලොව විශාලතම පුෂ්පය | (a) ලොව විශාලතම සත්ත්වයා |
| (ii) බෙයෝබැබ් ශාකය | (b) තාර හොට ප්ලැටිපසා |
| (iii) නිල් තල්මසා | (c) යෝධ රෙඩ් වුඩ් |
| (iv) බිත්තර දමන ක්ෂීරපායි සත්ත්වයා | (d) සොබාදහමේ ජල ගබඩාව |
| (v) ලොව විශාලතම ශාකය | (e) මහා බාධක කොරල් පරය |
| (vi) ජීවී සමූහයක විශාලතම නිමැවුම | (f) රැෆ්ලේෂියා |
| (vii) ලොව කුඩාම පක්ෂියා | (g) හුම්මානය - blowhole |
| (viii) මහ හඬ නංවමින් අහස සිසාරා පැතිරෙන උස් දිය බිඳු ධාරාව | (h) තෝමස් අල්වා එඩිසන් |
| (ix) විදුලි බුබුලේ නිර්මාතෘ | (i) චාල්ස් බැබේජ් |
| (x) පරිගණකයේ පියා ලෙස සලකන්නේ | (j) බිඟු සුටික්කා |

(ලකුණු 05)

03. (A) දී ඇති පරිපථ රූපසටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.




(i) පහත එක් එක් අක්ෂරය මගින් දක්වා ඇති කොටස් නම් කරන්න.

S - ..........................................................................

R - ..........................................................................

B - .......................................................................... (ලකුණු 1 1/2)

(ii) (V) දක්වා ඇති උපකරණයේ ප්‍රයෝජනය කුමක් ද? (ලකුණු 01)

(iii) එය පරිපථයට සම්බන්ධ කර ඇත්තේ කිනම් ආකාරයට ද? (ලකුණු 01)

(iv) පරිපථයේ ඇති වියළි කෝෂයට අමතරව තවත් කෝෂ 2 ක් ශ්‍රේණිගතව යෙදුවේ නම්
(a) A හි (b) B හි (c) V හි සිදුවන වෙනස්කම් වෙන වෙනම ලියන්න. (ලකුණු 1 1/2)

(v) R වෙනුවට නික්‍රෝම් කම්බි දඟරයක් යොදනු ලැබේ. නික්‍රෝම් කම්බි දඟරයේ දිග දෙගුණයක් දක්වා වැඩි කළේ නම්, A, B හා V සිදුවන වෙනස්කම් මොනවාද? (ලකුණු 1 1/2)

(vi) ඔබට වියළි කෝෂ 2 ක්, විදුලි පන්දම් බල්බ 3 ක් හා ස්විචයක් දී ඇත්නම්, බල්බ සමාන්තරව සහ කෝෂ ශ්‍රේණිගතව සම්බන්ධකර සකස්කර ගන්නා විදුලි පරිපථයක පරිපථ රූප සටහන අඳින්න. (ලකුණු 1 1/2)

12518

(B) රූපයේ දක්වෙන ආකාරයට කුඩා මෝටරයක LED බල්බ දෙකක් සම්බන්ධ කර ඇත. මෙම මෝටරය දක්ෂිණාවර්තව භ්‍රමණය කළ විට A ලෙස නම් කර ඇති LED බල්බය පමණක් දල් වේ. වාමාවර්තව භ්‍රමණය කළ විට B ලෙස නම් කර ඇති LED බල්බය පමණක් දල්වේ.




(i) ඉහත අවස්ථාවේදී මෝටරය ක්‍රියා කර ඇත්තේ කිනම් විදුලි ප්‍රභවයක් ලෙස ද? (ලකුණු 01)
(ii) ඉහත දක් වූ ප්‍රභවය හැර ඔබ දන්නා වෙනත් විදුලි ප්‍රභව දෙකක් නම් කරන්න. (ලකුණු 01)
(iii) LED පරිපථ සංකේතය ඇඳ දක්වන්න. (ලකුණු 01)

04. අම්ල, භෂ්ම සහ ජලය සමග විවිධ ද්‍රව්‍ය දක්වන අන්තර් ක්‍රියා පිළිබඳ ගවේෂණය සඳහා සකස් කළ කාර්ය පරිශ්‍රයක පහත සඳහන් දේ තබා තිබිණි.

- තනුක හයිඩ්‍රොක්ලෝරික් අම්ලය
- ආසුත ජලය
- මැග්නීසියම් කැබලි
- කුඩා ඉටි කැබැල්ලක්
- ඇලුමිනියම් කැබලි
- සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්
- කුඩු කරගත් හුණු ගල් ස්වල්පයක්
- ලුණු
- සජල කොපර් සල්ෆේට්

ඉහත ද්‍රව්‍ය ඇසුරෙන් පිළිතුරු සපයන්න.
(i) තනුක අම්ල සමග ප්‍රතික්‍රියා කර හයිඩ්‍රජන් වායුව පිටකරන ද්‍රව්‍ය 2 ක් නම් කරන්න. (ලකුණු 02)
(ii) මෙම පරිශ්‍රයේ තබා ඇති භෂ්මය නම් කරන්න. (ලකුණු 01)

(iii) (a) භෂ්ම සමග ප්‍රතික්‍රියාකර හයිඩ්‍රජන් වායුව නිපදවන ද්‍රව්‍යය නම් කරන්න. (ලකුණු 01)
(b) හයිඩ්‍රජන් වායුව විද්‍යාගාරයේදී හඳුනාගන්නේ කෙසේද? (ලකුණු 01)
(c) හයිඩ්‍රජන් වායුව පිරවූ බැලූනයක් අත්හැරිය විට ඉහළට යන්නේ ඇයි ? (ලකුණු 01)

(iv) ඇල් ජලය සමග ප්‍රතික්‍රියා නොකළ ද උණු ජලය සමග සෙමෙන් ප්‍රතික්‍රියා කරන ලෝහය නම් කරන්න. (ලකුණු 01)
(v) ජලය, අම්ල හෝ ලවණ සමග කිසිදු අන්තර් ක්‍රියාවක් නිරීක්ෂණය කිරීමට නොලැබෙන ද්‍රව්‍යය කුමක්ද? (ලකුණු 01)
(vi) හුණු ගල් කුඩුවල ඇති රසායනික සංයෝගය නම් කරන්න. (ලකුණු 01)
(vii) සජල කොපර්සල්ෆේට් ස්වල්පයක් රත් කළ විට සිදුවන වර්ණ වෙනස කුමක්ද? (ලකුණු 01)
(viii) ඉහත වර්ණය වෙනස් වූ කොපර් සල්ෆේට් ස්වල්පයකට ජලය දමූ විට එහි සිදුවන වර්ණ වෙනස කුමක් ද? (ලකුණු 01)

05. (A) බලයක් යෙදීමෙන් නිශ්චල වස්තු චලනය කළ හැකි අතර චලනය වන වස්තු නිශ්චලතාවයට පත් කළ හැකිය. බලය දෛශික රාශියකි.
(i) බලය දෛශික රාශියක් ලෙස හඳුන්වන්නේ ඇයි? (ලකුණු 01)
(ii) බලය ප්‍රමාණාත්මක ලෙස මැනීම සඳහා භාවිත වන ජාත්‍යන්තර සම්මත ඒකකය ලියා, එහි සංකේතය ද දක්වන්න. (ලකුණු 02)
(iii) යම් පෘෂ්ඨයක් මත ඇති වස්තුවකට පෘෂ්ඨයට සමාන්තරව බලයක් යොදන විට, බලය යොදන දිශාවට පෘෂ්ඨය මගින් බාධක බලයක් ඇති කරයි. මෙම බලය හැඳින්වෙන්නේ කෙසේ ද? (ලකුණු 01)
(iv) ඉහත (iii) හි සඳහන් කළ බලය වැඩි වීම වාසිදායක වන අවස්ථාවක් සඳහන් කරන්න. (ලකුණු 01)
(v) 1 kg ස්කන්ධය ඇති වස්තුවක් මත පෘථිවිය මගින් ඇති කරන ගුරුත්වජ බලය කොපමණ වේද? (ලකුණු 01)

(B) අධ්‍යයනයේ පහසුවට වස්තූන් අතර ඇති වන බල ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදනු ලබයි.

(i) එම කොටස් දෙක මොනවාද? (ලකුණු 01)

(ii) පහත දක්වෙන අවස්ථාවලදී කිනම් බල වර්ගයක් යොදනු ලබන්නේදැයි සඳහන් කරන්න.

| අවස්ථාව | බල වර්ගය |
|---|---|
| (a) ඇණයකට මිටියකින් පහර දීම | |
| (b) වැලි කඩදාසියක් මත තබා ඇති ලී කුට්ටියක් දුනු තරාදියෙන් ඇදගෙන යෑම. | |
| (c) ජලයේ පාවෙන වස්තුවක් මත ඉහළට ක්‍රියා කරන බලය | |
| (d) අදින ලද රබර් පටියක් මත ක්‍රියා කරන බලය | |

(ලකුණු 04)

06. ගංවතුර සහ නායයාම් වැනි ස්වභාවික විපත්වලට බොහෝ රටවල ජනතාවට විටින් විට මුහුණදීමට සිදු වේ. මෙවැනි විපත් වලදී සිදුවිය හැකි හානි අවම කිරීමට කටයුතු කිරීම ආපදා කළමනාකරණයේ එක් අංගයකි.

(i) ඉහත සඳහන් කළ ස්වභාවික විපත් හැරුණුවිට ශ්‍රී ලංකාවට බලපාන වෙනත් ස්වභාවික විපත් 2 ක් සඳහන් කරන්න. (ලකුණු 01)

(ii) ගංවතුර ඇතිවීමට බලපාන ප්‍රධාන හේතුව කුමක් ද? (ලකුණු 01)

(iii) ඔබ ඉහත (ii) හි සඳහන් කළ හේතුවට අමතරව ගංවතුර ඇතිවීම කෙරෙහි බලපෑ හැකි වෙනත් හේතු 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iv) ගංවතුරකට සූදානම් වීමේදී ඔබ විසින් සකසා ගනු ලබන ආපදා මල්ලක අඩංගු විය යුතු අත්‍යවශ්‍ය දෑ 4 ක් සඳහන් කරන්න. (ලකුණු 01)

(v) ජල ගැල්මකින් පැතිරී යා හැකි බෝවන රෝග 2 ක් දක්වන්න. (ලකුණු 01)

(vi) නායයෑම ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 01)

(vii) නායයෑම ඇතිවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් 2 ක් ලියන්න. (ලකුණු 02)

(viii) නායයෑමකට පෙර ඒ ආශ්‍රිත පරිසරයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ 2 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

07. (A) වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

(තිලාපියා, පටකය, කුස්කුටා, පිළිල, හූනා, ශිරා, ශෛලම, ධමනි, කාබන්ඩයොක්සයිඩ්, අර්තාපල්, උල්කාෂ්ම, ග්‍රාහක)

(i) ........................................ කොළ පැහැති පත්‍ර සහිත අර්ධ පරපෝෂි ශාකයකි.

(ii) ........................................ අනතුරකදී තම පැටවුන් මුව තුළට ගෙන ආරක්ෂා කරයි.

(iii) ........................................ පුනර්වර්ධනය දක්වයි.

(iv) සෛල රාශියක් එකතු වී ........................................ සෑදේ.

(v) හෘදයෙන් ඉවතට රුධිරය ගෙන යන්නේ ........................................ මගිනි.

(vi) ........................................ මිනිසාගේ ශ්වසන පද්ධතියෙන් බැහැර කෙරෙන බහිශ්‍රාවීය ද්‍රව්‍යයකි.

(vii) ශාකයක ජලය හා ඛනිජ ලවණ පරිවහනය කරනු ලබන පටකය ........................................ වේ.

(viii) ........................................ භූගත කඳකට උදාහරණයකි.

(ix) වායුගෝලය තුළ දී නොදැවී ඉතිරිවන උල්කා කැබලි ........................................ ලෙස හැඳින්වේ.

(x) බ්‍රහස්පති හා සෙනසුරු ග්‍රහයන් අතර ........................................ දැකිය හැකිය. (ලකුණු 05)

(B) නිවැරදි පිළිතුර යොදා වගුව සම්පූර්ණ කරන්න.

| අනු අංකය | පද්ධතිය | ඉටු කෙරෙන කාර්යය |
|---|---|---|
| (i) | ආහාර ජීර්ණ පද්ධතිය | |
| (ii) | | වාහු හුවමාරුව |
| (iii) | බහිස්‍රාවී පද්ධතිය | |
| (iv) | | ද්‍රව්‍ය පරිවහනය |
| (v) | | තම වර්ගයා බෝ කිරීම |
| (vi) | | දේහ ක්‍රියා පාලනය |

(ලකුණු 06)